**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**පුවත්පත් නිවේදනය**

**2021පෙබරවාරි 14 වන දින චෙන්නායිහිදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රකාශ කළ අදහස්**

මිත්‍රවරුනි,

අපගේ රජය සැමවිටම ශ්‍රී ලංකාවේ වෙසෙන අප දමිළ සහෝදර සහෝදරියන්ගේ සුබසිද්ධිය සහ අභිලාෂයන් පිළිබඳව සැලකිලිමත් වී ඇත. යාපනය ප්‍රදේශයේ සංචාරය කළ එකම ඉන්දීය අග්‍රාමාත්‍යවරයා වීම මට ගෞරවයකි. සංවර්ධන කටයතු හරහා ශ්‍රී ලංකාවේ දමිළ ප්‍රජාවගේ සුබසිද්ධිය අපි සහතික කරමු. අතීතයට වඩා බෙහෙවින් වැඩි සම්පත් අපගේ රජය විසින් දමිළ ජනතාවට ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර පළාත්හි අවතැන් දමිළ ජනතාවට නිවාස පනස් දහසක් ඉදිකිරීම සහ වතුකරයේ නිවාස හාරදහසක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතීන් අතර වේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව සැලකීමේදී අප ගාස්තු රහිත ගිලන්රථ සේවාවක් සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දුන් අතර එය දමිළ ජනතාව විසින් බහුලව භාවිතා කරන සේවාවකි. දික්ඔය ප්‍රදේශයේ රෝහලක් ද ඉදිකරන ලදී. ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා යාපනය සහ මන්නාරම දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කරමින් පවතී. චෙන්නායි සිට යාපනය දක්වා ගුවන් ගමන් ආරම්භ කර ඇත. ඉන්දියාව විසින් ඉදිකරන ලද යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය නුදුරේදීම විවෘත කිරීමට අපේක්ෂා කරන බව ඔබට දන්වා සිටින්නේ සතුටිනි. දමිළ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටළුව ද ශ්‍රී ලංකා නායකයන් සමඟ නිරන්තරව සාකච්ඡා කෙරෙමින් පවතී. ඔවුන් සමානාත්මතාවය,යුක්තිය, සාමය සහ අභිමානය සමඟින් ජීවත් වන බව සහතික කිරීමට අපි සැමවිටම කැප වී සිටිමු.

මිත්‍රවරුනි,

අපගේ ධීවරයන් විසින් මුහුණ දෙන ගැටළුව දිගු කලක සිට පවතී. එහි ඉතිහාසය පිළිබඳ කතා කිරීමට මා අපේක්ෂා කරන්නේ නැත. නමුත්, මාගේ රජය සැමවිටම ඔවුන්ගේ නිවැරදි අභිලාෂයන් ආරක්ෂා කරන බව මම ඔබට සහතික කරමි. ධීවරයන් ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගැනෙන සෑම අවස්ථාවකදීම ඔවුන්ව කඩිනමින් නිදහස් කර ගැනීමට අප කටයුතු කර ඇත. අපගේ පාලන කාලය තුළදී ධීවරයන් එක් දහස් හයසීයයකට වැඩි පිරිසක් නිදහස් කරගෙන ඇත. දැනට කිසිදු ධීවරයකු ශ්‍රී ලංකා අත්අඩංගුවේ නොමැත. එසේම, බෝට්ටු තුන්සිය දහතුනක් නිදහස් කරගෙන ඇති අතර ඉතිරි බෝට්ටු ප්‍රමාණය ද නිදහස් කරගැනීමට කටයුතු කරමින් පවතී.

***

***කොළඹ***

***2021 පෙබරවාරි 14***